# නිදහසින් පසු ශ්‍රී ලංකාව 6

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රයන්හි ඇති වූ වෙනස්වීම් මෙම මාතෘකාව ඔස්සේ හදාරමු.

1948 නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වේ. එහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන දේශපාලන පක්ෂ ක්‍රමය සහ කැබිනට් මණ්ඩලය ගැන අවධානය යොමු කරන අතර 1972 හා 1978 ජන රජ ව්‍යවස්ථා ද හැදෑරීම අවශ්‍ය වේ. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, කෘෂිකර්මය, රාජ්‍ය ව්‍යවසාය, කර්මාන්ත, සෞඛ්‍ය, ප්‍රවාහනය, සන්නිවේදනය යන ක්ෂේත්‍රවල ඇති වූ ප්‍රවණතා සහ 1948 සිට 1977 දක්වා ශ්‍රී ලාංකිකයන් ලබා ගත් සුභසාධක සේවා පිළිබඳ ව ද මෙහි දී සාකච්ඡා කෙරේනු ඇත.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ගැන තොරතුරු රැස් කරමු.

### ප්‍රජාතන්ත්‍රවාදය

ප්‍රජාත්‍රන්තවාදය නූතන ආණ්ඩුක්‍රම අතර වඩාත් ම ජනප්‍රිය ක්‍රමය වේ. ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්ගේ විග්‍රහය අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු ''මහජනතාව විසින් මහජනතාව උදෙසා ක්‍රියාත්මක කරනු ලබන මහජනතාවගේ පාලන ක්‍රමයකි'' සීලර් නැමැති දේශපාලන විචාරකයා ප්‍රජාතන්ත්‍රවාදය සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන ආණ්ඩුක්‍රමයක් ලෙස හඳුන්වා දී ඇත.

### සෘජු ප්‍රජාතන්ත්‍රවාදය

**ග්‍රීසියේ ඇතැන්ස් නුවරින් සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රභවය ලැබූ බව සැලකේ. ග්‍රීසියේ පුරවැසියෝ සියලු දෙනා එක් තැනකට රැස් වී එදිනෙදා පාලන කටයුතු පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කළහ.**

## නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

තම තමන් වෙනුවෙන් පාලන කටයුතු කරගෙන යාම පිණිස ජනතාව විසින් නියෝජිතයන් පත් කරන ක්‍රමය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යි. වර්තමානයේ සෑම රටක ම පාහේ ක්‍රියාත්මක වන්නේ මෙම ක්‍රමය යි. ජනගහනය වැඩි වීම, මිනිසුන්ගේ අවශ්‍යතා සංකීර්ණ වීම වැනි තත්ත්වයන් යටතේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අසීරු ය. ඊට විකල්පයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක කෙරෙන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පුරුදු පුහුණු කොට ගෙන ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක වීමට අවශ්‍ය මූලික ලක්ෂණ දෙකකි. ඒවා නම්
* නිදහස හා සමානාත්මතාව යි.

**නිදහස** - සියලු දෙනාට ම සමාජය තුළ ගෞරවනීය මිනිසුන් ලෙස ජීවත් වීමට ඇති අයිතිය නිදහස තුළින් සහතික කෙරේ.

**සමානාත්මතාව** - සියලු ම මූලික මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීමට සෑම පුද්ගලයකුට ම ඇති අයිතිය සමානාත්මතාව තුළින් සහතික කෙරේ.

**ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීමට අවශ්‍ය මූලික ලක්ෂණ සපුරාගත හැකි ප්‍රධාන මාර්ග දෙකකි. ඒවා නම්**

- කලින් කල මැතිවරණ පැවැත්වීම සහ
- සර්ව ජන ඡන්දබලය ක්‍රියාත්මක කිරීම යි.

## දේශපාලන පක්ෂ ක්‍රමය

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන අවිය ලෙස දේශපාලන පක්ෂ ක්‍රමය හඳුන්වා දිය හැකි ය. පක්ෂ ක්‍රමයකින් තොර ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතා කළ නොහැකි තරමට ම පක්ෂ ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදය එකට බද්ධ ව පවතී. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය පවත්වා ගෙන යාම සඳහා 17 වන සියවසේ දී පමණ දේශපාලන පක්ෂ ක්‍රමය ආරම්භ විය.

රටේ ආණ්ඩු බලය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් දේශපාලන පක්ෂ තම ප්‍රතිපත්ති මහජනතාව ඉදිරියේ තබනු ලැබේ. දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික, විදේශ ප්‍රතිපත්ති හා සමාජ සුභසාධනය වැනි ක්ෂේත්‍රවල ඉටු කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනවල අඩංගු වේ.

මහජනතාව මැතිවරණවල දී පක්ෂ ප්‍රතිපත්ති මත සිය වටිනා ඡන්දය භාවිත කරති. එහි දී ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාව මත ආණ්ඩුපක්ෂය හා විපක්ෂය තෝරා පත් කර ගනු ලැබේ.

## ද්විපක්ෂ ක්‍රමය

ද්විපක්ෂ ක්‍රමය ලෙස හැඳින්වෙන්නේ කිසියම් රටක ප්‍රබල දේශපාලන පක්ෂ දෙකක් පමණක් ක්‍රියාත්මක වීම යි. දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය සිදු වූ මහාබ්‍රිතාන්‍යයේ මුල් කාලයේ දී පැවතියේ දේශපාලන පක්ෂ දෙකක් පමණි. එහෙත් වර්තමානයේ තවත් පක්ෂ ආරම්භ වී ක්‍රියාත්මක කෙරේ. එසේ වුව ද අදටත් මහාබ්‍රිතාන්‍යයේ බලය ලබා ගත හැකි වන්නේ, කම්කරු සහ කොන්සවැටිව් යන පක්ෂ දෙකෙන් එකකට බැවින් එරට ද්විපක්ෂ ක්‍රමයක් පවතින රටක් ලෙස සැලකේ. ඇමරිකා එක්සත් ජනපදයේ ද ඇත්තේ ප්‍රබල පක්ෂ දෙකක් බැවින් ඒවා මාරුවෙන් මාරුවට බලයට පත් වේ. එබැවින් එම රටේ ද පවතින්නේ ද්විපක්ෂ ක්‍රමයක් ලෙස සැලකේ.

## බහු පක්ෂ ක්‍රමය

බහු පක්ෂ ක්‍රමය යටතේ කිසියම් රටක දේශපාලන පක්ෂ දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ.

ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය වැනි යුරෝපා රටවල පමණක් නො ව ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි බොහෝ ආසියාතික රටවල ද ක්‍රියාත්මක වන්නේ බහුපක්ෂ ක්‍රමයකි.

## කැබිනට් මණ්ඩලය

ශ්‍රී ලංකාවේ කැබිනට් මණ්ඩල ක්‍රමය ආරම්භ වූයේ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ය. එහි ප්‍රධානියා වන්නේ අගමැතිවරයා ය. ආණ්ඩුවේ විධායක කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ කැබිනට් මණ්ඩලයට යි. මුදල් පිළිබඳ මූලික වගකීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අණ පනත් යෝජනා කිරීම සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම ද කැබිනට් මණ්ඩලයට පැවරී ඇත.

## කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය සිද්ධාන්තයක් ලෙස කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම පිළිගෙන ඇත.

- ආණ්ඩුව මගින් ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන පනතක් පිළිබඳ ව ඕනෑ ම ඇමතිවරයකුට කැබිනට් මණ්ඩලය තුළ දී තම අදහස් හා විවේචන ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්තාව ඇත.
- එසේ වුව ද කැබිනට් සාකච්ඡාවකින් පසු ව කැබිනට් මණ්ඩලය ගනු ලබන සෑම තීරණයක් පිළිබඳ ව ඇමතිවරුන් සියලු දෙනා ම සාමූහික ව වගකිව යුතු වේ.
- පිළිගත් කැබිනට් ප්‍රතිපත්තියක් පිළිබඳ ව ප්‍රායෝගික ව ඇමතිවරුන් අතර වෙනස් අදහස් පැවතිය ද ප්‍රසිද්ධියේ ඒවා විවේචනය කිරීම නොකළ යුතු ය. එසේ කළහොත් කැබිනට් ප්‍රතිපත්ති බිඳ වැටෙන අතර මුළු කැබිනට් මණ්ඩලය ම අපකීර්තියට ලක් වේ.

- කැබිනට් මණ්ඩලය ගනු ලබන තීරණවලට සාමූහික ව වගකිව නොහැකි ඇමතිවරයකු වෙතොත් ඔහුට සිය ඇමති තනතුරෙන් ඉල්ලා අස් විය හැකි ය.
- එසේ නොමැති ව කැබිනට් තීරණ ප්‍රසිද්ධියේ විවේචනය කිරීම කැබිනට් ක්‍රමයේ මූලධර්මවලට පටහැනි වේ. කිසියම් ඇමතිවරයකු එවැනි ක්‍රියාවක් කළහොත් ඔහු කැබිනට් මණ්ඩලයෙන් ඉවත් කිරීමේ බලය විධායකයේ ප්‍රධානියා සතු ව ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට වගකීමට කැබිනට් මණ්ඩලය බැඳී සිටී.

"සාමූහික වගකීම නමැති අත්තිවාරම උඩ කැබිනට් මණ්ඩලය රඳා පවතී.'' සාමූහික වගකීමේ වටිනාකම මෙම වැකියෙන් ඔබට අවබෝධ වනු ඇත.

## කැබිනට් මණ්ඩලයේ සංයුතිය

- නිදහස ලැබීමෙන් පසු 1978 දක්වා ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රමය තුළ ශ්‍රී ලංකාවේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වූයේ අගමැතිවරයා ය. ඇමතිවරුන් පත් කිරීමේ බලය පැවතියේ අගමැතිගේ උපදෙස් අනුව නාමික විධායකයට ය. 1948-1972 දක්වා අග්‍රාණ්ඩුකාරයා නාමික විධායකය වූ අතර 1972-1978 නාමික විධායකය වූයේ ජනාධිපතිවරයා ය.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව වර්තමානයේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ විධායක ජනාධිපතිවරයා ය.
- ඇමතිවරුන් පත් කිරීමේ බලය ඇත්තේ ද ජනාධිපතිවරයාට ය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

කැබිනට් මණ්ඩලයේ කාර්යයන් පැහැදිලි වන ලෙස පංති කාමරය තුළ ආදර්ශ කැබිනට් මණ්ඩලයක් ක්‍රියාවට නංවන්න. අගමැති සහ ඇමති තනතුරු 4ක් හෝ 5ක් පමණ ඇසුරින් ක්‍රියාකාරකම සංවිධානය කරන්න.

## නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ඉතිහාසය

නිදහස ලබා ගැනීම සඳහා මූලික වූ ව්‍යාපාර ගණනාවක් බිහි වුව ද ඒවා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට උචිත දේශපාලන පක්ෂ ලෙස සංවිධානය වී නොතිබිණි.

1928 ඒ.ඊ. ගුණසිංහ මහතාගේ නායකත්වයෙන් කම්කරු පක්ෂය ආරම්භ විය.

## වාමාංශික පක්ෂ



රූපය 6.1
ආචාර්ය එන්. එම්. පෙරේරා

- බ්‍රිතාන්‍ය පාලන අවධියේ ක්‍රියාත්මක වූ අධ්‍යාපන ක්‍රමය අනුව වැඩිදුර අධ්‍යාපනය පිණිස එංගලන්තයට ගිය පිරිස්වලට එකල එංගලන්තය තුළ ක්‍රියාත්මක ව පැවති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිබඳ ව අත්දැකීම් ලබා ගත හැකි විය. ඔවුහු ආපසු සිය රටට පැමිණ තම අභිලාෂය ඉටු කිරීම සඳහා දියත් කළ වාමාංශික ව්‍යාපාරයේ කටයුතු සාර්ථක ව ගෙනයාම සඳහා **1935 දී ලංකා සමසමාජ පක්ෂය** පිහිටුවා ගත්හ. එහි නායකයා වූයේ ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා ය. 1936 පෙබරවාරි මාසයේ පැවැත්වූ දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තෝරා පත් කොට ගැනීම සඳහා මැතිවරණය පැවැත්වූ අවධිය වන විට,ලංකා සමසමාජ පක්ෂය මැනවින් සංවිධානය වී තිබිණි. එහෙත් පක්ෂය තුළ ඇති වූ මත ගැටුමක් හේතු කොට ගෙන පක්ෂය දෙකඩ විය. එහි ප්‍රතිඵල වශයෙන් 1943 එස්.ඒ වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් **"ලංකා කොමියුනිස්ට්"** පක්ෂය බිහි විය.
- 1943 දී ම ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතාගේ නායකත්වයෙන් **බෝල්ෂේවික් ලෙනින් පක්ෂය ආරම්භ කෙරිණි.**
- 1947 වන විට වාමාශික නායකයන් විසින් ලංකා සමසමාජ පක්ෂය, බොල්ෂෙවික් ලෙනින් පක්ෂය කොමියුනිස්ට් පක්ෂය සහ කම්කරු පක්ෂය ලෙස පක්ෂ කිහිපයක් ම පිහිටුවාගෙන තිබිණි. 1947 මහා මැතිවරණය වන විට වාමාශික ව්‍යාපාර මෙලෙස කොටස් කිහිපයකට බෙදී වෙන් වෙන් වශයෙන් සංවිධානය වීම මේ රටේ දේශපාලන පක්ෂ වර්ධනයේ විශේෂ ලක්ෂණයකි.

## එක්සත් ජාතික පක්ෂය

- 1947 මහා මැතිවරණයට මුහුණ දීම සඳහා උගත් ධනහිමි පංතිකයෝ ද පක්ෂයක් පිහිටුවා ගැනීමට කටයුතු කළහ. ඒ අනුව ලංකා ජාතික සංගමය, ලංකා යෝනක සංගමය, මුස්ලිම් සංගමය, සිංහල මහා සභාව එක්වී පැවැත්වූ සාකච්ඡාවලින් අනතුරු ව 1946 ඩී. එස්. සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් "**එක්සත් ජාතික පක්ෂය**" පිහිටුවා ගැනිණි.

  ද්‍රවිඩ සංගමය, ලංකා ඉන්දියානු සංගමය තවදුරටත් වෙනත් සංවිධාන ලෙස පෙනී සිටියහ.

## වෙනත් පක්ෂ ආරම්භ වීම

- දේශපාලන පක්ෂ පදනම් කොට ගෙන 1947 දී පැවැත්වූ ප්‍රථම මැතිවරණයේ සිට ශ්‍රී ලංකාවේ බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වූ බව ඔබට පෙනී යනු ඇත.
- 1947 මැතිවරණයෙන් පසු ලංකා සම සමාජ පක්ෂයෙන් ඉවත් වූ පිලිප් ගුණවර්ධන මහතා **විප්ලවකාරි සමසමාජ පක්ෂය** පිහිටුවා ගත්තේ ය.
- 1949 එස්.ජේ.වී. චෙල්වනායගම් මහතාගේ නායකත්වයෙන් **ෆෙඩරල් පක්ෂය** බිහි විය. මෙය ශ්‍රී ලංකාවේ බිහි වූ මුල් ම ජනවාර්ගික දේශපාලන පක්ෂය වීම ද සැලකිය යුතු වැදගත් කරුණකි.
- 1951 දී බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා අස් වී 1952 දී **ශ්‍රී ලංකා නිදහස් පක්ෂය** පිහිටුවා ගත්තේ ය.

  නිදහස් අධ්‍යාපනයෙන් ඵල නෙළා ගත් උගත් පිරිස්, මෙන් ම සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා එක් වූහ.
- 1965 රෝහණ විජේවීර මහතාගේ ප්‍රධානත්වයෙන් **ජනතා විමුක්ති පෙරමුණ** බිහි විය.
- 1977 **වාමාංශික එක්සත් පෙරමුණ** ගොඩනැඟීම ද ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ඉතිහාසයේ වැදගත් අවස්ථාවකි.

  ලංකා සමසමාජ පක්ෂය

  ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

  ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කැඩී ආ පිරිසකින් නිර්මාණය වූ මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය

  ජනතා විමුක්ති පෙරමුණින් කැඩී ආ පිරිසකින් නිර්මාණය වූ මහජන විමුක්ති පක්ෂය වැනි කණ්ඩායම් කිහිපයක් එක් වී වාමාංශික පෙරමුණ නිර්මාණය විය.

මේ ආකාරයට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ඉතිහාසය දෙස බලන විට මෙරට බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන බව දැකිය හැකි ය. බහු පක්ෂ ක්‍රමය යටතේ ස්ථාවර ආණ්ඩුවක් පිහිටු වීමට ප්‍රමාණවත් බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීම අසීරු වීම සාමාන්‍ය ලක්ෂණයක් වන බැවින් ශ්‍රී ලංකාවේ පක්ෂ කිහිපයක් සන්ධාන ගත වී සහාග ආණ්ඩු පිහිටුවීම ද පක්ෂ ක්‍රමයේ ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත.

## මැතිවරණ ක්‍රමයේ ඉතිහාසය

- 1947 මහා මැතිවරණය

  ප්‍රථම වතාවට පක්ෂ ක්‍රමය යටතේ ඡන්ද විමසීම පැවැත්වූයේ 1947 දී ය. ඡන්දදායකයෝ තම අගනා ඡන්දය භාවිත කිරීමෙන් පාර්ලිමේන්තු නියෝජිතයන් තෝරා ගැනීමට සහභාගි වූහ. දේශපාලන පක්ෂවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයන් හැරුණු විට ස්වාධීන අපේක්ෂකයෝ 82ක් තරගයට ඉදිරිපත් වූහ.

**1947 මහා මැතිවරණයේ ප්‍රතිඵල**

| | | |
|---|---|---|
| 1. | එක්සත් ජාතික පක්ෂය | 42 |
| 2. | කම්කරු පක්ෂය | 01 |
| 3. | ලංකා සමසමාජ පක්ෂය | 10 |
| 4. | ස්වාධීන | 21 |
| 5. | බෝල්ෂේවික් ලෙනින් පක්‍ෂය | 05 |
| 6. | කොමියුනිස්ට් පක්‍ෂය | 03 |
| 7. | ලංකා ඉන්දියානු සංගමය | 06 |
| 8. | ද්‍රවිඩ සංගමය | 07 |

මෙම ඡන්ද ප්‍රතිඵල දෙස බැලීමෙන් පෙනී යන්නේ එක ම පක්ෂයකටවත් ආසන සංඛ්‍යාවෙන් හරි අඩක්වත් දිනා ගැනීමට නොහැකි වූ බව යි. එම නිසා වැඩි ආසන ගණනක් දිනාගෙන සිටි එක්සත් ජාතික පක්ෂය, ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ ද සහාය ලබාගෙන ආණ්ඩුව පිහිටුවා ගත්තේ ය. ද්‍රවිඩ සංගමය ද ආණ්ඩු පක්ෂයට එක් විය. ප්‍රථම පාර්ලිමේන්තුවේ අගමැතිවරයා වූයේ ඩී.එස්. සේනානායක මහතා ය.



රූපය 6.2
ඩී. එස් සේනානායක
මහතා

- 1952 මාර්තු මස ඩී.එස් සේනානායක මහතාගේ අභාවය නිසා හිස් වූ අගමැති ධුරයට ඔහුගේ පුත්‍රයා වූ ඩඩ්ලි සේනානායක මහතා පත් විය.එතුමා නියමිත කාලයට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැර මහා මැතිවරණයකට මුහුණ දුන්නේ ය.
  ආණ්ඩු පක්ෂයට අයත් වූ මුළු මන්ත්‍රී සංඛ්‍යාව 60 දෙනෙකි.

  කැබිනට් මණ්ඩලය ඇමතිවරු 14 දෙනෙකුගෙන් සමන්විත විය.



රූපය 6.4
ඩඩ්ලි සේනානායක මහතා

- 1952 දෙවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය පැවැත්වූ අතර එහි දී එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ ආසන වැඩි සංඛ්‍යාවක්, එනම් ආසන 54ක් දිනා ගැනීමට සමත් විය. ඒ අනුව එම පක්ෂයේ නායකයා වූ ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරට පත් විය.

  1953 පැවති මහා හර්තාල් ව්‍යාපාරය නිසා ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරෙන් ඉල්ලා අස් වූ අතර එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා වූ ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා අගමැති තනතුරුට පත් විය.



රූපය 6.3 ප්‍රථම කැබිනට් මණ්ඩලය

- ඊළඟ මැතිවරණය පැවැත්වීමට නියමිත ව තිබුණේ 1957 මැයි මාසයේ දී වුව ද රටේ උද්ගත වෙමින් තිබූ ප්‍රශ්නවලට මුහුණදීමට අසමත් වූ අගමැති ජෝන් කොතලාවල 1956 පෙබරවාරි මාසයේ දී ආණ්ඩුව විසිරුවා හැරියේ ය. ඒ අනුව 1956 අප්‍රේල් මාසයේ පැවැත්වීමට නියමිත වූ මැතිවරණයට මුහුණ දීම සඳහා බණ්ඩාරනායක මහතා එවකට ඔහු සමඟ විරුද්ධ පක්ෂයේ සිටි පිලිප් ගුණවර්ධන මහතා සහ තවත් සුළු පක්ෂ කිහිපයක් ද ස්වාධීන මන්ත්‍රීවරුන් කිහිපදෙනකු ද සමඟ එක් වී **මහජන එක්සත් පෙරමුණ** පිහිටු විය.

- 1956 මහා මැතිවරණයෙන් ජය ගත් බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත් විය. එහෙත් එතුමාට වැඩි කලක් එම තනතුර දැරීමට ඉඩ නො ලැබිණි.

- 1959 බණ්ඩාරනායක අගමැතිතුමාගේ අභාවයෙන් පසු සුළු කාලයකට එම පක්ෂයේ විජයානන්ද දහනායක මහතා අගමැති තනතුරට පත් විය. 1960 දී මැතිවරණ දෙකක් පැවැත්වීය. ඒ වන විට පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාව ද 151 දක්වා වැඩි කර තිබිණි. එම මැතිවරණයේ තවත් විශේෂ ලක්ෂණයක් වූයේ, වයස අවුරුදු 18 ට වැඩි සියලු ම පුරවැසියන්ට ඡන්ද බලය පාවිච්චි කිරීමට අවස්ථාව ලැබීම යි. 1960 මාර්තු මාසයේ පැවැත්වූ මැතිවරණයෙන් කිසිදු පක්ෂයකට බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමට නොහැකි විය. එක්සත් ජාතික පක්ෂය ආසන 50ක් ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 46ක් ද දිනාගත් අතර ඉතිරි ආසන 55 සෙසු පක්ෂ විසින් දිනා ගන්නා ලදී.



රූපය 6.5 එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා


ඒ අවස්ථාවේ පක්ෂ කිහිපයක් සමඟ එකතු වී ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව පිහිටුවිය. එහෙත් පාර්ලිමේන්තුව විවෘත කිරීමේ දී පැවැත්වූ රාජාසන කථාවෙන් ම ආණ්ඩුව පරාජයට පත් විය.



රූපය 6.6 එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

අනතුරු ව 1960 ජුලි 20 දින ඊළඟ මහ මැතිවරණය පැවැත්වීය. එම මැතිවරණයෙන් ජයගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වූ සිරිමාවෝ ඩයස් බණ්ඩාරනායක මහත්මිය අගමැතිනිය ලෙස පත් වූවා ය. ඇය මුලින් ම පාර්ලිමේන්තුවට පැමිණියේ, සෙනෙට් සභාවට නම් කළ මන්ත්‍රීවරියක වශයෙනි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැති තනතුරට පත් වීමත් සමඟ ලෝකයේ ප්‍රථම අගමැතිනිය ශ්‍රී ලංකාවෙන් බිහි වීම ද ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සිදු වූ වැදගත් සිදු වීමකි.

- පුවත් පත් සමාගම් ජනසතු කිරීමේ ප්‍රශ්නය මත සී.පී.ද. සිල්වා මහතා ප්‍රමුඛ මන්ත්‍රීවරුන් 14 දෙනකු රජයෙන් ඉවත් වීම නිසා 1964 දෙසැම්බර් මාසයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව බිඳ වැටිණි. ඒ අනුව 1965 මාර්තු මාසයේ ඊළඟ මැතිවරණය පැවැත්වීය. එම මැතිවරණයේ දී ආණ්ඩුව පිහිටුවීමට ප්‍රමාණවත් බහුතරයක් කිසිදු පක්ෂයකට නොලැබිණි. එහෙත් තවත් පක්ෂ කිහිපයක සහාය ලබා ගෙන එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව පිහිට වූ අතර



රූපය 6.7 ඩබ්ලිව්. දහනායක මහතා

ඩඩ්ලි සේනානායක මහතා සිවුවැනි වරටත් අගමැති තනතුරට පත් විය. එම ආණ්ඩුව නියමිත ආයු කාලය වන 1970 වර්ෂය දක්වා පැවතිණි.

- 1970 මහා මැතිවරණයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය සහ ලංකා සමසමාජ පක්ෂය එකතු වී **පොදු පෙරමුණ** පිහිටුවා ගන්නා ලදී. මහා මැතිවරණයෙන් ජය ගත් පොදු පෙරමුණ සහාග ආණ්ඩුවක් පිහිටු විය. සහාග ආණ්ඩුව තුළ ඇති වූ මත භේද හේතු කොට ගෙන 1975 ලංකා සම සමාජ පක්ෂය ද, 1976 කොමියුනිස්ට් පක්ෂය ද ආණ්ඩුවෙන් ඉවත් වූහ. 1977 පැවැත්වූ මහ මැතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය බලයට පත් විය.

## 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිදහස ලැබීමෙන් පසු ව ද ප්‍රධාන වශයෙන් මේ රටේ ක්‍රියාත්මක වූයේ 1946 ලංකා රාජාඥාව මගින් ප්‍රකාශයට පත් කොට තිබූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යි. (සෝල්බරි ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ පළමු වන පරිච්ඡේදයෙන් කියවා ගන්න.)



රූපය 6.8 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1947 ලංකා නිදහස් පනත ඇතුළු තවත් අණ පනත් කීපයක් එකතු කිරීමෙන් සකස් කර ගත් ආණ්ඩුක්‍රමය 1948 නිදහස ලැබීමෙන් පසුව ක්‍රියාත්මක කෙරිණි. එම ව්‍යවස්ථාව 1972 දී ජනරජ ව්‍යවස්ථාව සම්මත කරගන්නා තෙක් ම වලංගුව පැවතිණි.

මෙම රාජ ආඥා හා නියෝග මගින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව නිදහස් ශ්‍රී ලංකාවේ පාලනය කෙරෙහි ද විවිධ බලපෑම් කිරීමට ඉඩ ප්‍රස්තා සලසාගෙන තිබිණි. ඒ අනුව ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු ක්ෂේත්‍රවලට මැදිහත්වීමේ බලතල බ්‍රිතාන්‍ය ආණ්ඩුව සතු විය.

1950 දශකයේ සිට දේශපාලනඥයන්, බුද්ධිමතුන්, විචාරකයන්, ලේඛකයන් වැනි සමාජයේ ප්‍රභූ කොටස් විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීමේ අවශ්‍යතා පෙන්වා දෙන ලදී. එසේ වුව ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ ස්ථිරසාර මාවතකට පිවිසියේ 1970 මහා මැතිවරණයෙන් පසු ව යි. 1970 මහා මැතිවරණය සඳහා තරග කළ සමගි පෙරමුණ ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් පිහිටු වීමට ජනතා වරමක් ඉල්ලා සිටියේ ය.

ඔබ විසින් තෝරා පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එකවර ම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස රැස් වීමට ද නව ව්‍යවස්ථාවක් සකස් කිරීමට ද බලය ලබා දෙන මෙන් අපි ඔබෙන් ඉල්ලමු. එම ව්‍යවස්ථාව මඟින් ලංකාව නිදහස් ස්වෛරී ජනරජයක් බවට ප්‍රකාශ කරනු ලබන අතර ඒ තුළින් සමාජවාදී ප්‍රජාතන්ත්‍රික අරමුණු ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ද සියලු පුරවැසියන්ගේ මූලික මානව අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස ද ආරක්ෂා කර දීමට අපි බලාපොරොත්තු වෙමු.

1970 සමගි පෙරමුණ
මැතිවරණ ප්‍රකාශය

## 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ අරමුණු

1. ශ්‍රී ලංකාව ස්වෛරී ස්වාධීන සමූහාණ්ඩුවක් බවට පත් කිරීම
2. සමාජවාදී ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ගොඩ නැඟීමට අවශ්‍ය ව්‍යවස්ථාමය ව්‍යුහයක් සකස් කොට දීම
3. මෙරට ජනතාවගේ නිදහස ඇතුළු නන්වැදෑරුම් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කොට දීම යනාදිය ප්‍රධාන විය.


## 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ

1. 1972 දක්වා "ලංකා" නාමයෙන් හැඳින් වූ අපේ රට මෙතැන් සිට "ශ්‍රී ලංකා"යන නාමයෙන් හැඳින්වීම ආරම්භ විය.
2. 1956 අංක 33 දරණ පාර්ලිමේන්තු පනතින් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කොට තිබිණි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයක් බවට පත් කරනු ලැබී ය.
3. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දීම.
4. ජනතාවට පරමාධිපත්‍ය බලය පැවරිණි

   නිදහසින් පසු ව ක්‍රියාත්මක කළ රාජාඥා හා ඇතැම් විධිවිධාන අනුව ලංකාවේ පාර්ලිමේන්තුවට පරමාධිපත්‍ය බලය හිමි නො වී ය. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමුවන ඡේදයෙහි ජනතා පරමාධිපත්‍යය පිළිගෙන ඇත.

   - ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරනු ලබන මාර්ග
   - සර්වජන ඡන්ද බලය
   - මූලික මිනිස් අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කිරීම ප්‍රධාන වේ.

ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වන්නේ තෝරා පත් කොට ගනු ලබන ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික රාජ සභාව මඟිනි.
1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3- 4 වගන්ති.



රූපය 6.9 කොල්වින් ආර් ද සිල්වා මහතා
(1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක ඇමතිවරයා)

**ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය**

**ජනතාව විසින් තෝරා පත් කොට ගන්නා ලද නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ජාතික රාජ්‍ය සභාව මගින් ක්‍රියාත්මක කෙරේ.**

**ජනතාවගේ විධායක බලය**

**ජනතාව විසින් තෝරා පත් කර ගන්නා ලද මන්ත්‍රීවරුන් අතුරින් අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.**

**ජනතාවගේ අධිකරණ බලය යුක්තිය පසිඳලනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු උසාවි පද්ධතිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම උසාවි පද්ධතියේ විනිශ්චයකරුවන් මහජනතාවගේ නියෝජිතයකු වන අගමැතිතුමාගේ නිර්දේශ පරිදි ජනාධිපති විසින් පත් කරනු ලැබේ.**

**මේ අනුව මහජනතාව විසින්**

- ව්‍යවස්ථාදායකය හරහා නීති පනවනු ලැබේ.
- විධායකය හරහා නීති ක්‍රියාත්මක කරනු ලැබේ.
- අධිකරණය හරහා යුක්තිය පසිඳනු ලැබේ.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

"1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජනතා පරමාධිපත්‍යය තහවුරු විය." මේ මතය පැහැදිලි කිරීමට තොරතුරු රැස් කරන්න.

5. අග්‍රාණ්ඩුකාරතුමා වෙනුවට නාමමාත්‍ර ජනාධිපති තනතුර ඇති කිරීම

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායිකාව වූයේ බ්‍රිතාන්‍යයේ මහ රැජින යි. නීති ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ විනිශ්චයන් ලබා දීම රැජිනගේ නාමයෙන් ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබී ය.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අග්‍රාණ්ඩුකාර තනතුර අහෝසි කොට නාමමාත්‍ර විධායක තනතුර ඇති කිරීම නිසා එංගලන්තයේ රැජින, රාජ්‍යනායක ධූරය දැරූ කාලය අවසන් විය. එතැන් පටන් නාමමාත්‍රික ජනාධිපතිවරයා රාජ්‍ය නායක තනතුරට පත් විය. ජනාධිපතිවරයා අගමැතිගේ උපදෙස් මත ක්‍රියාකිරීමට නියමිත විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

නාමමාත්‍රික ජනාධිපතිතුමා පත් කරන ආකාරය ද එතුමා සතු වගකීම් ද විස්තර කරන්න.

6. 1948 සිට ක්‍රියාත්මක වූ ද්විමණ්ඩල පාර්ලිමේන්තුව වෙනුවට ජාතික රාජසභාව පිහිටුවනු ලැබිණි.

1972 ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ජනතා පරමාධිපත්‍යය ක්‍රියාත්මක වන උත්තරීතර ආයතනය ජාතික රාජ සභාව විය.

## ජාතික රාජ්‍ය සභාව සතු කාර්ය භාරය

ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
මහජන මුදල් පරිපාලනය කිරීම, මනා පරිපාලනය මඟින් රටේ ආරක්ෂාව ලබාදීම සහ ජනතාවගේ දුක්ගැනවිලිවලට පිළියම් යෙදීම

7. 1971 හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් උත්තර මන්ත්‍රී මණ්ඩලය අහෝසි කොට තිබිණි. ඒ අනුව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් සමන්විත වූ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද තහවුරු කොට එය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කරනු ලැබී ය.

මෙලෙස ජාතික රාජ්‍ය සභාවට තේරී පත් වන මහජන නියෝජිතයන්ගේ මාර්ගයෙන් ජනතාවට පාලනයට හවුල් වීමේ අවස්ථාවක් උදා කෙරිණි. නව ආණ්ඩුක්‍රමයක් සම්පාදනය කිරීමේ බලය ද ඇත්තේ ජනතාවට බව සනාථ කොට ඇත.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පනතක් සම්මත වන ආකාරයත් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පනතක් සම්මත වන ආකාරයත් සංසන්දනාත්මක ව කණ්ඩායම් ක්‍රියාකාරකමක් මඟින් ඉදිරිපත් කරන්න.

8. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය (විධායකය)

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මහා මැතිවරණයකින් පසු ආණ්ඩුව පිහිටු වූ පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස පත් වෙයි. අගමැතිතුමා තමාට ඉතා හිතවත් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ඇතුළු කිරීමෙන් ඇමති මණ්ඩලය පිහිටුවා ගැනීම සිදු කෙරෙයි. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විධායකය ලෙස නීති ක්‍රියාත්මක කරනු ලැබේ.

නාමමාත්‍රික විධායකය විසින් ඇමතිවරුන් පත් කරනු ලැබුව ද ඒ සඳහා උපදෙස් දෙනු ලබන්නේ අගමැතිතුමන් විසිනි. ඒ අනුව නිදහසෙන් පසු ව 1972 දක්වා ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රමය සහ 1972 ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් මණ්ඩලයේ සංයුතිය බලතල සහ කාර්ය භාරයන් අතර එතරම් වෙනසක් නැත.

9. ස්වාධීන අධිකරණය

1947 සිට ක්‍රියාත්මක වු අධිකරණයට අදාළ රාජාඥා පනතක් වෙනුවට 1972 දී නව අධිකරණ රටාවක් බිහි විය. ඊට අදාළ අණ පනත් කීපයක් මෙසේ දැක්විය හැකි ය.

1. 1973 අංක 44 දරන යුක්තිය පසිදලීමේ පනත
2. කාර්මික හා ආරවුල් පනත
3. මුස්ලිම් විවාහ හා දික්කසාද පනත

**මෙම පනත් යටතේ අධිකරණ ආයතන පද්ධතියක් පිහිටු විය**

ශ්‍රේෂ්ඨාධිකරණය
මහා අධිකරණය
දිසා අධිකරණය
මහේස්ත්‍රාත් අධිකරණය
කම්කරු උසාවි
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

මෙම උසාවි පද්ධතියේ ප්‍රධානතම උසාවි දෙක වූයේ ශ්‍රේෂ්ඨාධිකරණය හා මහා අධිකරණය යි.

දිසා අධිකරණය ඒ ඒ දිස්ත්‍රික්කවල සියලු ම සිවිල් නඩු පිළිබඳ ක්‍රියා කිරීමට නියමිත විය. මහේස්ත්‍රාත් අධිකරණයට ඒ ඒ දිස්ත්‍රික්කවල සියලු ම අපරාධ නඩු පිළිබඳ විනිශ්චය කටයුතු භාර විය.

කම්කරු උසාවි අධිකරණ සේවා උපදේශක මණ්ඩලය හා අධිකරණ සේවා විනය මණ්ඩලය මඟින් ක්‍රියාත්මක විය.

අධිකරණයේ ස්වාධීනත්වය රැකීම සඳහා අධිකරණ සේවා උපදේශක මණ්ඩලය හා අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටුවනු ලැබිණි.

1972 දක්වා ශ්‍රී ලංකා උසාවියෙන් වරදකරුවකු වූවකුට බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලයට අභියාචනාවක් ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබිණි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම බලය සම්පූර්ණයෙන් ම අහෝසි කොට දැමී ය.

1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය විභාග කළ ශ්‍රී ලංකාවේ අධිකරණය දුන් තීන්දුවට විරුද්ධ ව ප්‍රිවි කවුන්සලයට චූදිතයෝ අභියාචනයක් ඉදිරිපත් කළහ. ඔවුන් සියලු දෙනාට ම එහි දී නිදහස ලබා දුනි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට අභියෝගයක් වූ අතර 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම අභියාචනා අයිතිය අහෝසි කොට දමනු ලැබිණි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

"බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කිරීමේ වැදගත්කම" පැහැදිලි කෙරෙන රචනාවක් ලියන්න.

10. මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදැරුම් නිදහස

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රථම වතාවට මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කරනු ලැබුවේ 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි. එහි 6 වන පරිච්ඡේදයේ 18 වගන්තියෙන් ඉතා පුළුල් ලෙස ශ්‍රී ලංකාවාසි ජනතාවට ආරක්ෂා කොට දෙන්නා වූ මූලික මිනිස් අයිතිවාසිකම් දක්වා ඇත.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- මූලික මිනිස් අයිතිවාසිකමක් යනු මොනවා දැ යි පැහැදිලි කරන්න.
- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ව ඇති මූලික මිනිස් අයිතිවාසිකම් කිහිපයක් ප්‍රදර්ශනය කිරීමට බිත්ති පුවරුවක් සකස් කරන්න.

1948 පෙබරවාරි මස 4 වන දින බ්‍රිතාන්‍ය කිරීටය ශ්‍රී ලංකාවට නිදහස ලබා දුන්නේ ය. එසේ වුව ද එය පූර්ණ නිදහස නො වී ය. බ්‍රිතාන්‍ය කිරීටය මගින් ශ්‍රී ලංකාව තව දුරටත් පාලනය කිරීම සඳහා වූ බැමි කිහිපයක් ඉතිරි කරගෙන තිබූ බව අපි ඉහත දුටිමු. එය ඩොමීනියන් තත්ත්වයක් වූ අතර එම තත්ත්වයෙන් මිදී නියම නිදහස කරා ළඟා වූයේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමත් සමඟ ය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවට පූර්ණ ස්වෛරී බලතල හිමි ආණ්ඩුක්‍රමයක් ලබා දුනි. මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.


- 1947 හා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල පවතින සමාන හා අසමාන ලක්ෂණ පෙළගස්වන්න.

| | සමාන ලක්ෂණ | | අසමාන ලක්ෂණ | |
|---|---|---|---|---|
| | 1947 | 1972 | 1947 | 1972 |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |

## 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

1977 පැවති මහා මැතිවරණයෙන් 50%කට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ද 80%කට වැඩි ආසන සංඛ්‍යාවක් ද ලබමින් 1977 ජුලි මස 21 වන දින ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් යුක්ත එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ බලය හිමි කර ගැනීමට සමත් විය.

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමට ජේ.ආර්. ජයවර්ධන මහතා විධිවිධාන යෙදී ය.



රූපය 6.10 ජේ. ආර්. ජයවර්ධන මහතා

සමහර රටවල විධායකය කෙළින් ම ජනතාව විසින් තෝරා පත් කර ගන්නා අතර එසේ තෝරා පත් කර ගනු ලබන විධායකයට නියමිත අවුරුදු ගණනක කාල සීමාවක් තුළ ව්‍යවස්ථාව කෙරේ බලාපොරොත්තු තැබීමට අවශ්‍ය නැත. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රංශය, බ්‍රිතාන්‍යය සහ ඇමරිකානු ක්‍රමවල සංකලනයකි. එබඳු විධායකයක් ඉතාමත් ම ශක්තිමත් විධායකයකි. තෝරා පත් කොට ගනු ලබන ව්‍යවස්ථාදායකයට අවශ්‍ය පදයට නටන්නේ නැතුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයෙන් දෝෂාරෝපණය එල්ල වීම ගැන බියක් නැතුව නිවැරදි ව ජනප්‍රිය නැති තීරණ ගැනීමට ශක්තියක් ඇති ව බලයේ රැඳී සිටීමට හැකි ය. අද අප මුහුණ පා සිටින සංවර්ධනය වන රටකට මෙය ඉතාම අවශ්‍ය ක්‍රමයකැ යි මට සිතේ.

ජේ.ආර්. ජයවර්ධන
යුගයක පියසටහන

නව ව්‍යවස්ථාව හඳුන්වාදීමේ පරමාර්ථය එහි නිර්මාතෘවරයාගේ ඉහත දැක්වූ සටහනින් ඔබට මනාව පැහැදිලි වන්නට ඇත.

## දෙවන ජන රජ ව්‍යවස්ථාවේ දක්වා ඇති අරමුණු

- ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයක අරමුණු සාක්ෂාත් කොට ගැනීම
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ස්ථිරසාර ජනරජ මූලධර්ම තහවුරු කිරීම
- ධර්මිෂ්ට නිවහල් ජනරජයක් බිහි කිරීම
- නිදහස, සමානාත්මතාව, යුක්තිය, මූලික අයිතිවාසිකම් හා අධිකරණයේ ස්වාධීනත්වය ජනතාවට සහතික කිරීම

## මෙම අරමුණු සපුරා ගැනීමට යොදා ඇති විධිවිධාන

### ජනතා පරමාධිපත්‍යය

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය බව දක්වා ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි "පරමාධිපත්‍යය" යනුවෙන් අදහස් වන්නේ "උත්තරීතර" බලය යි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මෙම උත්තරීතර බලය මහජනතාව වෙත පවරා ඇත.

## ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක වන ආකාරය

ඡන්ද බලය ක්‍රියාත්මක වීම
මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම
ජනතාවට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යනාදී බලතල හිමි කොට දී තිබීම

**ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය** - ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් වන මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුව තුළ දී නීති සම්පාදනය කරනු ලැබේ.

**ජනතාවගේ විධායක බලය** - ජනතාව විසින් ජනාධිපතිවරණයකදී තෝරා පත් කොට ගනු ලබන ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ නියෝජිතයන් අතුරින් කැබිනට් මණ්ඩලය සකස් කර ගැනීමෙන් පසු ව එය ද එකතු කර ගෙන නීති ක්‍රියාත්මක කරනු ලැබේ.

**ජනතාවගේ අධිකරණ බලය** - මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන ජනාධිපතිතුමා විසින් විනිශ්චයකරුවන් පත් කරනු ලැබේ. එම විනිශ්චයකරුවන් විසින් අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ උසාවි පද්ධතිය ඔස්සේ ක්‍රියාත්මක කරනු ලැබේ.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

1. පහත 1,2,3 වශයෙන් නම් කොට ඇති පින්තූර දෙස බලන්න. ඒවා හඳුනාගෙන නම් කරන්න.
2. එම ආයතන මඟින් ඉටු වන කාර්යයන් දෙක බැගින් ලියන්න.
3. ජනතා පරමාධිපත්‍යය පෙන්වන ප්‍රබලතම උපකරණය ඡන්ද බලය යි., මෙම කියමනට පක්ෂ ව කරුණු හතරක් ඉදිරිපත් කරන්න.


(1)


(2)